සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

බාසා පරමේස්වර - බස් පරමිසුරු යන ගරු පට බැඳි උගතුන් ගැන නිනව්වක් මට නැත. ගුරුලු හෝමි විදුසක්විති ආදි උගතුන් උවද තමන් බාසා පරමේස්වරයන් ලෙස හඳුන්වා ගත් තැනක් අද්දැය් මම නොදනිමි.

පරමේස්වර යන වචනයේ තේරුම මගේ හිතට වැදී ඇත්තේ කෝටිප්‍රාප්ත - කෙලපත් - කෙලපැමිනි යනුවෙනි. මා එය තේරුම් ගෙන ඇති හැටි නිවැරදි නම් යම් විසේක (විශයක) කෙලපත් කෙනකු අතින් ප්‍රමාද දෝස - වැරදීම් සිදුවන්නේ ඉතාමත් කලාතුරකිනි. එය වැරදීමක් ලෙස ම සලකනු මිස එය රැක ගත යුත්තක් හෙවත් අනුයායුත්තක් (අනුගමනය කල යුත්තක් කර ගැනීම මුලාවකි.

පරි ශුද්ද - පිරි සිදු - පිරිසිදු වි ඇත. කිසි යම් උගතකු ගේ ලියවිල්ලක එය පරිසුදු - පිරිසිඳු යනුවෙන් ලියවී තිබෙන්නට පුලුවන. -පරසිදු මෙ මිහිතල - මදුරට පුරෙහි සාගල" යන කවිගීයේ පරසිදු යනු පිරිසිදු නොවේ. ප්‍රසිද්ද යන්න සිය-බසට බිඳ ගත් සැටියි. 'රටට පරකාසේ - ගෙදර මරගාතේ' යන කියමනේ 'ප්‍රකාශ' යන්න (සිංහලට) සිය බසට පැමින ඇත්තේ 'පරකාස' යනුවෙනි. ප්‍රමාද - පරමාද, ප්‍රවේනි - පරවේනි යන පද හැඳි ඇත්තේත් ඒ විදියටය. වලකට වැටී පීනමින් සිටි ගෝනකු නිසා හැදුනු -ගෝනා - පීනු - වල" පසුව -ගෝනපීනුවල" වන්නට ඇත.

වැරදි දේ හරියයි ගන්නා හරිදේ නුරුස්නා පුඟුලෝ එදත් සිටියහ; අදත් සිටිති

විවෘත 'ආ' හඬ සහිත 'නා' යන්න සංවෘත 'න' යන්නටත් විවෘත 'ව' යන්න සංවෘත 'ව' යන්නටත් මාරු වී ඇත. ඒ 'වල' තිබි ගම්පියස - ගෝනපීනුවල" වී ඇතැයි සිතමි. එය කිසියම් උගතකුගේ ලියවිල්ලක -ගොනා පීනුවල - ගොනාපීනුවෙල" යනුවෙන් ලියවී තිබෙන්නටත් පුලුවන. පරිසුදු - ගොනාපීනුවෙල නිවැරදි සේ සලකා ඒ අනුයන්නන්ද සිටින්නට පුලුවන.

වැරදි දේ හරියයි ගන්නා හරිදේ නුරුස්නා පුඟුලෝ එදත් සිටියහ; අදත් සිටිති;

ගම්පහ පලාතේ 'කිරිඳිවැල' වැරදි ලෙස වියහරට පත් වචනයක් සේ පෙනේ. කිරිඳි යනු ගොයම් අතර වැවෙන වල් පැළෑටියකි.

කිරිඳි ගස් මිස කිරිඳි වැල් ගැන මා අසා නැත. ඒ නිසා කිරිඳිවැල යන්න කිරිඳිවෙල යන්නේ පෙරලියක් විය හැකිය. මට කිරිඳිවැල යන්න කිරිඳිවෙල කිරීමේ උවමනාවක් නැතත් කිරිඳිවෙලම කිරිඳිවැල වී ඇති බව මම දැන සිටිමි.

මීට දස වස් හතරකට පහකට පමන පෙර තිබුනු 'ලාරුගොඩ වත්ත' අද 'ඔරුගොඩවත්ත' වීමත් එදා 'ලාරුවල' ම අද 'ඔරුවල' වීමත් එදා 'අලවතුගොඩ' අද 'අලවත්තාගොඩ' වීමත්, එදා 'තල්පෙවෙල' අද 'තල්පාවිල' වීමත් ගැන සිතන විට සමහර පුඟුලන්ගේ උවමනාවට සීතා මතා වෙනස් කරන ලද ගම් නම් ද ඇති බව පෙනේ. ආසුබෝද ආරියසේන සුරීන් තම නම 'අනුබුදු අරිසෙන්' යනුවෙන් වෙනස් කර ගෙන ඇත. ආසුබෝද යන පෙලපත් නමේ තේරුම මට සීතා ගත නොහැකිය. හැම පෙලපත් නමක්ම කිසියම් තේරුමක් ඇතිව හැඳී ඇත. කුරුප්පු, අමරදෝරු, සල්ගාදු, ලැනරෝල්, ප්‍රනාන්දු ආදී පෙලපත් නම්වල තේරුම සිංහල බාසාවෙන් දිය නොහැක. ඒවා වෙනත් බාසාවකින් පැමිනි වචනයි. කන්ඩම්බි, පෙරුම්පුල්ලි, මනම්පේරි, කන්නංගර ද එබඳු නම් ය. සමහර පෙලපත් නම් කුලය හා බැඳී පැවතීම සමහරුන්ට 'කරුමයක්' වී ඇත. -ඔයා මාතර විරතුංගලා/වනිගතුංගලා/කුමාරතුංගලා අදුනනවාද ? ඒ ගොල්ලෝ: නෑයොද?" වැනි ප්‍රශ්න කෙනෙකුගෙන් අසන්නේ ඔහු කවර කුලයට අයත් දැය් දැන ගැනීම සඳහාය.

මාතරට පලාතේ තොටගමුවේ රානුල හාමුදුරුවන් නම් තමන් බස් පරමිසුරන් බව කියා ඇත. ඒඒ ක් බසකට නොවේ; සබසකටය. රත්මලනේ දර්මාරාම හාමුදුරුවන්ගේ පොතක ඒ ස - බස ලෙස දක්වා ඇත්තේ මගද සංස්කෘත ප්‍රාකෘත අපබ්‍රංස පය්සාචි සවිරයේනි ය. මා මේ විස්තර දැන ගත්තේ ගනේවත්ත පාලිතයන් සමග කළ කතා බහකිනි. මා නොදැන සිටි යමකින් මා දැනුවත් කිරීම ගැන ඔවින්ට පින් දෙමි. කෝටිවේ යුගයේ දමිලය බතා උස් තැනක තිබි බව අපි දනිමු. රජ මැදුරේ පවා එය උස් තැනක වැජඹිනි. ඉතින් රානුල හාමුදුරුවන් දමිලය නොදැන සිටින්නට හේතුවක් නැත. ඔවින් දැන සිටි - ඔවින් පරමිසුරු වූ ස - බසින් සිංහලත් දෙමලත් හැළි ඇත. ඔවින් සිංහල සහ දෙමල යන දෙ-බසටත් පරමිසුරු වූ නම් ඔවින්ට -ස-බස් පරමිසුරු" යන ගරු පට -අට බස් පරමිසුරු" යනුවෙන් වෙනස් කිරීමට සිදු වේ. කෙසේ වුවද රානුල හාමුදුරුවන් සිංහල බාසාවට පරමිසුරු නුවුවන් ලෙස නියන්නට (නිගමනය කරන්නට) අපට සිදු වේ.

යමකුට බාසාවක් ඉගෙනීම සඳහා ගුරුවරයකු සිටිය යුතුය. අද මෙන් පොත් පත් නොතිබුනු එදා යමක් ඉගැන්වීම සඳහා ගුරුවරයකු සිටිය යුතුම විය. රානුල හාමුදුරුවන් ප්‍රාකෘත අපබ්‍රංස පය්සාචි සවිරසේනි යන සු -බසින් (බාසා සතරින්) පරමිසුරන් කිරීමට සමත් වූ උගතකු හෝ උගතුන් ගැන තොරතුරු සොයා ගත නොහැකිවීම අබාග්‍යකි. (-භාග්‍ය" යන්න සිංහලට බිඳී ඇත්තේ -බග" කියායි. එය වරනැගි තැනක් ගැන නිනව්වක් මට නැත) ඒබ ාසා හතර කෙබඳු ඒවා විය හැකි ද යනු හෝ ඒ බාසාවල හෝඩිය කෙබඳු විය හැකිද යනු හෝ දන්නා කෙනකු අද සොයා ගත නොහැක.

'පය්සාචි' යනු පිසා-චයන්ට අයත් බාසාව බව සුමංගල දිස්නරියේ සඳහන් වේ. පිසාචයන් නුදුටු ඔවින් ගැන කිසිවක් නොදන්නා මට 'පය්සාචි' බාසාවද අපබ්‍රංසයකි.

සිංහල බාසාව පිලිබඳ අගතැන්පත් කෙනකු

MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka

Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE

- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE

- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

www.multinational.com.au

E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696